ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ ඡායාරූප හා චිත්‍ර, අවශ්‍ය සංවේදීතාවෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම, පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්වද ඉදිරිපත් කිරීමට පුවත්පත විශේෂයෙන් සැලැකිලිමත් විය යුත්තේය යනුවෙන් මාධ්‍ය ආචාර ධර්ම තුළ දැක්වේ. එවැනි භාවිතාවක් අවශ්‍ය වීමේ හේතුව වන්නේ, සංවේදී දර්ශනයන් නැරඹීම සෑම ප්‍රේක්ෂකයෙකුටම අපහසු විය හැකි නිසායි.

මේ අතර, ඝාතනයට ලක්ව ඇති බව පැවසෙන අටළුගම 9 හැවිරිදි දැරියගේ මළ සිරුර සොයාගැනීම සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී, එම මළ සිරුරේ දසුන් මාධ්‍ය මගින් අනාවරණය වී තිබුණේ පහත ආකාරයෙනි.

1) ඒ අනුව, මෙම සිදුවීම වාර්තා කිරීමේදී මළ සිරුරේ දර්ශන ඉදිරිපත් කිරීම අවශ්‍ය යැයි ඔබ සිතන්නේ ද?

2) එසේ ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ යැයි ඔබ සිතන්නේ නම්, එම සංවේදී දසුන් බොඳ කොට දැක්වීමට මාධ්‍ය උත්සුක විය යුතු යැයි ඔබ නොසිතන්නේ ද?

3) කිසිදු බොඳ කිරීමකින් තොරව ඉදිරිපත් කරන සංවේදී දසුන් නැරඹීමට නොහැකි ප්‍රේක්ෂකයින්ද සිටිය හැකි නොවේ ද? එසේම, එය මිය ගිය දැරියගේ පවුලේ අයගේ සිත් වේදනාවට ද හේතු විය හැකි නොවන්නේ ද?

ඔබේ අදහස?